# ශයිනි



සෙනුලි රත්නායක

# ශයිනි


## සෙනුලි රත්නායක

කතෘ


කතෘගේ වෙනත් කෘති
දගකාර ලේන් පැංචා


මහ/ මහාමායා බාලිකා විදුහල
3 - B ශ්‍රේණිය


2026.05.10

978-624-211-156-8

# පිදුම

මෙම කතාව මා මුහුණ දුන් සත්‍ය සිදුවීමකි.

මෙසේ ලියන්නට අදහස ලබා දුන් මාගේ

අප්පච්චිටත්, අම්මාටත් මෙම කතන්දර පොත

ආදරයෙන් පුදකරමි. මට නැණ නුවණ ලබා

දුන් ගුරුවරුන්ටද ගෞරවයෙන් පුදකරමි.



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පුජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වු හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මුලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු  දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

මම සෙනුලි.

අපේ ගෙදර ජීවත් වෙන්නේ අම්මා, අප්පච්චි, මල්ලි සහ මම.

එක දවසක් උදේ පාන්දර අම්මා කුස්සියේ උයමින් ඉද්දි කුස්සිය පිටිපස්සේ කෙඳිරි ගාන සද්දයක් ඇහිලා තියෙනවා.

අම්මා කුස්සිය පිටිපස්ස බලන්න ගියා.

අනේ!

එතන හිටියේ දුඹුරු පාට චූටි බලු පැටියෙක්.



එයා බොහොම අසරණව හිටියා.

එයා අම්මගේ කකුල් වලට දැවටි දැවටී හුරතල් වුණා.

අම්මා එයාට කිරි ටිකක් දුන්නා.

බලු පැටියා ඒක එක හුස්මටම බීලා දැම්මා.

එදා මට පාසල් දවසක්.

අම්මා මට කතා කළා.
“දෝණි! බලු පැටියෙක් ඇවිත්. නැගිටින්න!”

මම ඉක්මනටම
නැගිට්ටා.
මල්ලිවත්
නැගිට්ටුවා.



අනේ!
එයා හරිම ලස්සන චූටි බලු පැටියෙක්.

අපි දෙන්නව දැක්ක ගමන්
එයා අපේ ඇඟේ දැවටි දැවටී හුරතල් වුණා.

මම අම්මට කිව්වා,

“අනේ අම්මේ... අපි එයාව තියාගමුකෝ!”

බලු පැටියා අපි පාසල් ගිහින් එනකන් බලාගෙන හිටියා.

අපි යතුරුපැදියේ එන සද්දේ ඇහුණාම එයා පාරට දුවගෙන ආවා.

මම ආයෙත් අම්මගෙන් ඇහුවා,

“අනේ අම්මේ... අපි එයාව තියාගමුකෝ.”

අම්මා හිනා වෙලා කිව්වා,

“හා... අපි මෙයාව තියාගමු.”

මට ඉහේ මලක් පිපුණා වගේ සතුටු හිතුණා.

අම්මා එයාට ලස්සන නමක් දුන්නා.

“අපි එයාට ශයිනි කියමු.”



ශයිනි අපේ පවුලේම කෙනෙක් වගේ වුණා.

අම්මා ශයිනිව නාවලා, කන්න දීලා, හොඳින් බලාගත්තා

අප්පච්චි ශයිනිට ලස්සන කූඩුවක් හදලා දුන්නා.



මමයි මල්ලියි ශයිනිත් එක්ක හැමදාම සෙල්ලම් කළා.

එක දවසක් සවස ශයිනි ගෙදර හිටියේ නැහැ.

අපි එයාට කතා කළා.

"ශයිනි... ශයිනි..."

එතකොට පාර පැත්තෙන්
බලු පැටියෙක් මහා හයියෙන් කෑගහන
සද්දයක් ඇහුණා.

අපි ඉක්මනට පාරට දිව්වා.

අනේ!
ඒ ශයිනි තමයි.

කාර් එකකට අපේ ශයිනිව හැප්පිලා.

ශයිනිගේ දකුණු කකුල කැඩිලා වෙන්න ඇති
එල්ලෙනවා.මට හරිම දුක හිතුණා.
මගේ ඇස් වලින් කඳුළු වැටුණා.

අම්මයි, අප්පච්චියි
ශයිනිව රෝහලකට අරගෙන ගියා.

වෛද්‍යවරු ශයිනිගේ කකුලට
පරීක්ෂණ කරලා බැලුවා.



ඒකට පස්සේ ඔවුන් කිව්වා,
"ශයිනිට සැත්කමක් කරන්න වෙයි" කියලා.

ශයිනිගේ සැත්කම අවසන් කරලා,

ශයිනිව අරගෙන ගෙදර ආවා.

දැන් ශයිනිට වෙනදා වගේ
සෙල්ලම් කරන්න බැහැ.

ඒත් එයා
කකුල එල්ලගෙන
මල්ලියගෙයි මගෙයි පස්සෙන්ම එනවා.



පව්!
එයාට අමාරු වුණත්
අපිව සතුටු කරන්න තමයි බලන්නේ.

ශයිනි හිටියේ හරිම වේදනාවකින්.
මට ඒක හොඳටම දැනුණා.

අපි එයාට කෑම, බීම, බෙහෙත් දීලා
හොඳින් බලා ගත්තා.

ඒත්...
ශයිනිව හැප්පුන වාහනයේ අය
එයා ගැන බලන්න
කවදාවත් ආවේ නෑ.

අලුත් අවුරුදු දවසත් උදා වුණා.
ශයිනි කූඩුව ඇතුලේ හිටියේ හරිම
නිශ්ශබ්දව.

මට හරිම අමුතු දුකක් දැනුණා…

අම්මා උයන අතරේ
අප්පච්චි කෑ ගැහුවා,

“ශයිනි හුස්ම අදිනවා!”

අපි ඉක්මනට ගියා.
ශයිනි හයියෙන් හුස්ම ගන්නවා.

අම්මා එයාව බදාගෙන ඇඬුවා.
මායි මල්ලියිත් ඇඬුවා.

ටික වෙලාවකින්…
ශයිනි හුස්ම නතර කළා.

ශයිනි අපිව දාලා ගියා.

මගේ හිතට එදා
ලොකු දුකක් දැනුණා.

අප්පච්චි ගෙදර අසල
ලොකු වළක් කැපුවා.

අම්මා ශයිනිව රෙදි කෑල්ලක ඔතලා
වළට දාන්න ගෙනාවා.

අපි හැමෝම
පස් මිට මිට දාලා ශයිනිට සමුදුන්නා.

අම්මා ප්‍රාර්ථනා කළා,
“මේ වගේ දුකක් වෙන කවුරුත් නොවිඳින්න.”
කියලා.



ඊළඟ දවසේ
අපි ශයිනිව මතක් කරලා  සත්තුන්ට කන්න
දුන්නා.

ශයිනි අදටත්
අපේ හිතේ ජීවත් වෙනවා.

මම මේ කතාවෙන්
හැමෝටම කියන්න කැමතියි…

සත්තුන්ව අසරණ කරලා
පාරේ අතහැරලා දාන්න එපා.

එයාලට ආදරෙන් සලකන්න,
බලාගන්න.

සත්තුත් අපි වගේම
ජීවත්වෙන්න කැමති අය.

අපි ආදරේ දුන්නොත්,
එයාලත් අපිට ආදරේ කරනවා.

ශයිනි අපිට
ඒ වටිනා පාඩම ඉගැන්නුවා.





# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වු වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නුතන පාසල නුතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් **“හේමමාලා උපහාර”** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මුලික අරමුණයි.
මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුළු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)

978-624-211-156-8